# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 3 ශ්‍රේණිය - පරිසරය (සැප්තැම්බර්-1 සතිය)

## 12 තේමාව - මිනිස් හැසිරීම්

**දුවේ පුතේ මෙහි සඳහන් ක්‍රියාකාරකම කරන්න. ඔබ වැඩිහිටියෙක් (අක්කා, අම්මා, තාත්තා, සීයා, අත්තම්මා) වැනි අයෙකුගේ උදව් ලබාගන්න.**

- ❖ පහත සඳහන් වැකි ඔබට ඇසීමට, කියවීමට කියන්න.
- ❖ ඔබ දෑස් පියාගන්න.
- ❖ එම වැකිවලින් කියවෙන දේ ඔබට හොඳින් ලැබෙන විට ඔබේ සිතට දැනෙන්නේ මොනවාද?
  - වාතය හුස්ම ගැනීමට.
  - පරිසරය (පිරිසිදු වටපිටාවක්)
  - භාෂාව (අදහස් හුවමාරු කරගන්න.)
  - හොඳ ගතිගුණ (ආදරය, කරුණාව, දයාව)
  - අන් අයට උදවු කිරීම, ගරු කිරීම.
  - බෙදා හදා ගැනීම.
  - පිරිසිදුව හා පිළිවෙළට සිටීම.
- ❖ අනිත් අයට ඇස් පියාගැනීමට කියා ඔබ ඒ අයගෙන් අහන්න.

1. මේවා අපට ජීවත්වීමට අවශ්‍ය දේවල්. මේවා ඔබට හොඳින් ලැබෙන විට ඔබට ඇතිවන්නේ සතුටක්ද?/අසතුටක් ද? නිවැරදි පිළිතුරට ඉරක් අඳින්න.

   - පාසල් නිවාඩු නිසාත්, සංචරණ සීමා නිසා අම්මා තාත්තා ගෙදර ම නිසා ගෙදර ගොඩක් වැඩ කරනවා ඇතිනේ (පිරිසිදු කරනවා, ගෙවත්ත හදනවා, කෑම පිළියෙළ කරනවා) මේ හැම වැඩේටම දුව පුතා උදවු කරන්නම ඕනෑ.
   - කණ්ඩායමක් එකතු වෙලා වැඩක් කරපුවහම ඉක්මනින් කාර්ය සාර්ථක කරගන්න (පුළුවන්ද / බැරිද?)

2. පුතා, දුව දන්නවාද මේ කතන්දර.

   තොප්පි වෙළෙන්දාගේ කතන්දරය
   කපුටා සහ කේජු කෑල්ල.
   ඉබ්බා අහසින් ගිය හැටි.

   - ඔබ දන්නවානම් ගෙදර අයට කියලා දෙන්න. කරලා පෙන්වන්න.
   - ඔබ දන්නේ නැතිනම් ගෙදර වැඩිහිටියෙකු ලවා අසා දැනගන්න.

ඔබට බොහෝ ම ස්තුතියි. ලබන සතියෙත් හමුවෙමු.

E nanapiyasa 3 ශ්‍රේණිය පරිසරය -12 තේමාවට අදාල වීඩියෝව නරඹන්න.